# මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 02 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ඔක්තෝබර් 22 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය.

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුනු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් මාසයේ උසාවි දඩ මුදල වූ රු. 308,715 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගත් රු. 7,907,000 ක් වූ ණය මුදල ගිණුම්ගත කිරීමේදී සදොස් ලෙස සමුච්චිත අරමුදල් ගිණුමට හර කර, ණය අරමුදල් ගිණුමට බැර කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු. 7,907,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 65,821,926 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

02. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

2.1 මුල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවු පුනරාවර්තන වියදම රු. 810,560 ක් වු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවු පුනරාවර්තන වියදම රු .2,782,333 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිග ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිග ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට වු සම්ච්චිත හිගය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් හා බදු | 633 | 179 | 2,682 |
| (ii) | බදු කුලී | 968 | 949 | 199 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,039 | 1,039 | - |
| (iv) | වෙනත් ආදායම් | 10,223 | 6,296 | 3,654 |

2.2.2 උසාවි දඩ

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 1,689,494 |
| (ii) | මුද්දර ගාස්තු | 597,100 |

2.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්.

වටිනාකම රු. 175,000 ක් වූ කැබ් රථයක් වර්ෂ 08 ක කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) මෝටර් ග්‍රේඩරයක්, ටිපර් රථ 3 ක් හා ට්‍රැක්ටර් රථ 2 ක් වාණිජ හෝ කර්මාන්ත ව්‍යවසායක යෙදවීමෙන් රු.4,250,000 ක කුලී ආදායමක් ඇස්මේන්තු කර තිබුණි. වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය හඳුනාගත හැකිවන පරිදි ගිණුම් වාර්තාසකස් කර නොතිබුණි.

(ආ) සභාවට පැවරී ඇති කාර්යයන් ඉදිරි වර්ෂවලදී ඉටුකිරීමට සැලසුම් කර ඇති ආකාරය දැක්වෙන සංයුක්ත සැලැස්මක් හා සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.5 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේ සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කකරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) ණයගැති හා ණයහිමි පාලනය